# ශ්‍රී ලංකාව ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා සංවිධානයේ සාමාජිකත්වය ලබා ගනී



*කොරියානු ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමා කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ලේකම් එස්. අමරසේකර මහතා පිළිගනිමින්*

ආසියානු රටවල් 12 ක ඉහළ පෙළේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2009 නොවැම්බර් මස 03 වන දින කොරියානු ජනරජයේ සෝල් නුවරදී පවත්වන ලද ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා සංවිධානය පිහිටුවීමේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව ද සහභාගී වෙමින් එහිදී අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

මෙම අවස්ථාවට කොරියානු ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය චුන්ග්-අන්-චැන් (Dr. Chung Un-Chan) මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය. කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ලේකම් එස්. අමරසේකර මහතා, කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක දිසානායක මහත්මිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) එස්. ඇම්ටියගොඩ මහතා යන නිලධාරීහු ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගී වූහ.

සාමාජික රටවල ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ ආහාර හා කෘෂිකර්ම තාක්ෂණය දියුණු කිරීම සඳහා සහයෝගය ලබාදීමේ මූලික අරමුණ ඇතිව කොරියානු ජනරජය විසින් මෙම සංවිධානය ආරම්භ කිරීමට මූලික පියවර ගන්නා ලදී. මේ යටතේ ආසියානු ආහාර සංස්කෘතික මධ්‍යස්ථානයක් (Asian Food Culture Centre) ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීමටත් යෝජනා විය. සිය සාමාජික රටවල පවත්නා නෛතික රාමුව තුළ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කරමින් හා තිරසාර ලෙස උපයෝජනය කරමින් තිරසාර කෘෂිකාර්මික පරිසරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ද මෙම සංවිධානය විසින් ලබා දෙනු ලැබේ. මීට අමතරව මෙම සංවිධානය විසින් සිය සාමාජික රටවල කෘෂිකර්ම සංවර්ධනය හා ආහාර කර්මාන්තය සඳහා අවශ්‍ය හැකියා වර්ධනය (Capacity Building) හා තාක්ෂණය හුවමාරු කර ගැනීම සඳහා නිසි අවස්ථා සලසා දීමට ද නියමිතය.

මෙම සංවිධානය හා සම්බන්ධ වීම සඳහා එවකට ගරු කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**පී.ඒ.එම්.එස්. ඇම්ටියගොඩ**

**නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) මූලස්ථාන**

ආරම්භක සාමාජිකයින් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, කාම්බෝජය, කොරියානු ජනරජය, ලාඕසය, පිලිපීනය හා වියට්නාමය යන රටවල් හය අවබෝධතා සිහිපත් ගිවිසුමකට එළඹී ඇත. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ලේකම් සිරිපාල අමරසේකර මහතා මෙම අවබෝධතා සිහිපතට අත්සන් තබන ලදී.

බංගලාදේශය, ඉන්දුනීසියාව, නේපාලය, තායිලන්තය, මොන්ගෝලියාව හා උස්බෙකිස්ථානය යන රටවල් නිරීක්ෂකයින් හා මෙම සංවිධානයේ තාවකාලික සාමාජිකයින් ලෙස සහභාගී වූහ. මෙම සංවිධානය ආරම්භ කිරීමේ හා එකී සංවිධානයේ විවිධ අවස්ථා හා කටයුතු සංවිධානය කිරීමේ වගකීම කොරියානු ජනරජයේ ග්‍රාමීය සංවර්ධන පරිපාලන (Rural Development Administration) ආයතනය වෙත පැවරී ඇත. ආසියානු ආහාර හා



මෙම අවස්ථාවට සහභාගී වූ ආසියානු රටවල් 12 ක සාමාජිකයින්

කෘෂිකර්ම සහයෝගිතා සංවිධානය ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකා කොරියා ග්‍රාමීය සංවර්ධන පරිපාලනය පිළිබඳ විද්‍යාර්ථයින්ගේ සංගමය (SriLanKoRDAA) කොරියානු ජනරජයේ ග්‍රාමීය සංවර්ධන පරිපාලන ආයතනය හා ඒකාබද්ධව කටයුතු කරන ලදී. මෑතකදී පිහිටුවා ගන්නා ලද මෙම ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා සංවිධානයේ ප්‍රධාන කාර්යාලය කොරියාවේ ස්ථාපිත කරනු ලබන අතර එහි උපකාර්යාලය මෙම සංවිධානයේ සාමාජික රටවල ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

## තීරණය වෙනස් කරන්න නම් එපා

මොලය මොන ලෙඩ දැම්මත් ඔබ නොසැලී ඉන්න. ඔබේ තීරණය වෙනස් කරන්න නම් එපා. තදින්ම ඉන්න. කොච්චර ලෙඩ දැම්මත් අරක්කුවත්, සිගරැට්වත්, මත්කුඩුවත් දෙන්නම එපා. බඩ පිපුණාට කමක් නෑ. කන්න පිරියක් නැතිවුනාට කමක් නෑ. නින්ද නොගියට කමක් නෑ. ඇනුම් ගියාට රැස්සන් නැති වුනාට කමක් නෑ. කමක් නෑ. කමක් නෑ. සඳ ගිලුණත් කමක් නෑ. හිරු ගිලුනත් කමක් නෑ. ඔබ මා ළඟ ඉන්නවා නම් කමක් නෑ. කමක් නෑ. අත බුරුල් කරන්නම එපා. තදින්ම ඉන්න. තදින්ම අල්ලා ගන්න. දණ ගහගෙන තදින් කියන්න. සෑම පැයකම විනාඩි 10 බැගින් දණ ගහගෙන කියන්න. මෙහෙම මේ සාගිනි අභ්‍යාසය එක දවසක් කළොත් ඔබේ මොළය ඔබට බය වෙනවා. ඔබේ මොලයට සුපුරුදු පරිදි ඔක්කොම අකර්මන්‍ය වෙනවා. අඩපණ වෙනවා. ඔබට පුළුවන් දිනන්න. ඔබම ඔබේ මොලයට පුරුදු කරපු නරක පුරුදු වලින් මොලය නිදහස් කරගෙන ඔබට අවශ්‍ය නම් උදර ජිවිතයක් උද කරලා දෙනවා ඔබේ මොළය. එයා බලාගෙන ඉන්නවා කවදාද මට හරි දේ කරන්න කියලා හරියට කියන්නේ. එදාට මං ඒ දේ කරනවා කියලා